Name of the Person /Institution	Description of Commitments	Project	Sub Project	Object Code	Financing Code	Maximum Commitment Ceiling In terms of FR 94(2) Provisions (Rs.)	Total Cost Estimate In terms of FR 94(3) (Rs.)	Commitment & Liability Amount (Rs.)
1. Ministries/Government Department								
.....								XX
.....								XX
Total								
2. State Corporations/Statutory Boards								
.....								XX
.....								XX
Total								
3. Others (Private Parties)								
MMG Construction	Supply of 314 Nos.1.5 Ton rock Bolders for Boossa Revetment						1,051,272.00	244,404.00
MMG Construction	Supply of 665 Nos.1.0 Ton rock Bolders for Boossa Revetment						1,506,890.00	917,346.00
MMG Construction	Supply of 275.0m³of (2-250Kg) Mix rock material for Boossa Revetment						799,975.00	799,975.00
MMG Construction	Supply of 374.0m³of (6*9) Rubble rock material for Boossa Revetment						1,311,244.00	838,494.96
MD Construction	Supply of 20 Ton Excavator on hired basis for Boossa Revetment						2,945,280.00	2,945,280.00
MD Construction	Supply of 3CX type Backhoe Loader on hired basis for Boossa Revetment						1,383,550.00	1,383,550.00
Galleland Metal	Revetment						5,477,700.00	3,221,830.00
MMG Construction	Supply of 845 Nos 1.5 Ton rock Bolders forKahawa Godagama Revetment						2,864,550.00	169,500.00
MMG Construction	Revetment						3,253,800.00	228,754.90
MD Construction	Revetment						4,787,850.00	4,237,639.60
MMG Construction	Supply of 3Cube Tipper on hired basis for Kahawa Godagama Revetment						680,000.00	680,000.00
Maha Construction	Construction of 120m Gabion wall at Kankasanturei In Jaffna						11,994,200.00	8,001,580.00
Gim Genaral Trading	gabion wall						708,708.00	708,708.00
Adham Bawa & Sons	Supply of 12 Ton Excavator on hired basis for Kinniyadi gabion wall						1,172,920.00	1,172,920.00
Dakshina Enterprises	T Groyne						4,166,400.00	2,817,319.68
Dakshina Enterprises	Groyne						7,766,200.00	3,312,583.00
Nimal Enterprises	Supply of 2160 Nos 1.5 Ton rock Bolders for Waskaduwa 120m Revetment						6,346,512.00	6,346,512.00

ඇමුණුම - (vii)

අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශනය

දෙපාර්තමේන්තුවේ නම: **වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ**

වියදම් ශීර්ෂ අංකය: 291

වැඩසටහන් අංකය හා නාමය:

දිනය	වවුචර් අංකය	ආදායකයාගේ නම	ගෙවීමේ ස්වභාවය	ගණන (රු)
		නැත		

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමිසාරිස් (මුදල්)
දිනය : 23/01/2025

කේ. තිරුසුගාති
ප්‍රධාන මූල්‍යවේදී
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත්
කළමනාකරණ දෙපාර්තමේන්තුව
මඩිවෙල්ල, කොළඹ 10.

* නම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව කොරකුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

ඇමුණුම - (viii)

2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් වක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2025.12.31 දිනට තත්ත්ව වාර්තාව

වියදම් ශීර්ෂ අංකය: 291 දෙපාර්තමේන්තුවේ නම: වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ

අනු අංකය	බැංකුවේ නම	ගිණුම් අංකය	2025.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.)	2025.12.31 දිනට ඉදිරි ගෙවීම් අනුව ශේෂය (රු.)	2025.12.31 දිනට බැංකුවට ඉදිරිවත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්)	අවසන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය
1	ලංකා බැංකුව	7042641	165,453,777.99	-	-	2025 දෙසැම්බර්
2	ලංකා බැංකුව	7040117	-	-	-	

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

ප්‍රධාන ගිණුම් නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූල්‍ය) /මණ්ඩලාධිපති (මූල්‍ය)
දිනය: 23/12/2025

ඒ. ජී.එස්. ප්‍රනාන්දු
ප්‍රධාන ගණකාධිකාරී
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
මඩිවෙල්ල, කොළඹ 10.

3.10 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.'000

ආදායම් කේතය	ආදායම් සංග්‍රහයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසාන ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2003-02-99	පරිපාලන ගාස්තු සහ ගාස්තු	42,000	42,000	90,960	216.57%
2002-02-99	පොලී - වෙනත්	1,600	1,600	1,764	110.25%

3.11 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	419,000.00	413,000.00	396,787.00	96.07 %
ප්‍රාග්ධන	382,000.00	388,000.00	252,838.74	65.16 %

3.12 වෙනත් අමාත්‍යාංශයෙන් / දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන නොලැබුණි

අදාල නැත

3.13 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ශේෂය 31/12/2025	2025/12/31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාවට අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි සහ ව්‍යුහ	2,341,450,066.20	2,341,450,066.20		100%
9152	යන්ත්‍රෝපකරණ හා ප්‍රවාහන	345,729,388.94	345,729,388.94		100%
9153	ඉඩම්	138,882,250.00	138,882,250.00		100%
9154	අස්පෘෂ්‍ය වත්කම්	14,528,000.00	14,528,000.00		100%

3.14 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. එන්ඩබඑල්/ඩී/සීසී&සීආර්එමඩී/ දැක්වූ අංකය / உமது இல. / Your No. 01/2025/49

දිනය / திகதி / Date: 2026 මැයි 21 දින



අධ්‍යක්ෂ ජනරාල්
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 291 - වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සමිපිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වානුගණනය කළ මතය

ශීර්ෂය 291 - වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණනේදීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකනාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකනාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සවිලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සවිලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එම ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සවිලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා නොගත් හෙක්ටයාර් 0.5808 ක් වූ මාතර හා මොරටුව පිහිටි ඉඩම් 02ක් රු.32,700,000 කට සහ ගාල්ල උනවටුන ප්‍රදේශයේ පිහිටි ඉඩමක් රු.20,000,000 කට තක්සේරු කර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛනයේ සඳහන් ගාල්ල පිලැගොඩ ක්ෂේත්‍ර කාර්යාලය පවත්වාගෙන යන රු.7,000,000 ක්වූ දෙපාර්තමේන්තුව සතුව පවතින ඉඩම් අපහරණය සිදු කර ඇති ආකාරයෙන් මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් වූ ACA 6 හි දැක්වීම් නිසා මූල්‍ය තත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ වූ ඉඩම් ශේෂය රු. 7,000,000 කින් අඩුවෙන් දැක්වීණි.

(ඇ) අයිතිය දෙපාර්තමේන්තුව සතුනොවූ මාතර හා මොරටුව පිහිටි ගොඩනැගිලි 02ක් රු.48,353,000 කට තක්සේරු කර මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි, මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් වූ ඒසිඒ 06 ආකෘතියට අනුව ගොඩනැගිලි ශේෂය රු.157,005,616 ක් ලෙස දක්වා නිබුණද, විගණනය වෙත ඉදිරිපත් කරන ලද උපලේඛනයට අනුව ගොඩනැගිලි එකතු වටිනාකම් රු.148,397,595 ක් වූයෙන් රු.8,608,021 වෙනසක් විය.

(ඉ) අයිතිය දෙපාර්තමේන්තුව සතුව පවතින යතුරුපැදි 06ක වටිනාකම් තක්සේරු කර සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් මූල්‍ය නොවන වත්කම් යටතේ හිඟුම්ගත කිරීමට කටයුතු කර නොනිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි, මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් වූ ඒසිඒ 06 ආකෘතියේ වටිනාකම් රු. 18,210 ක්වූ යතුරු පැදි 02ක් සහ රු.11,900,000ක් වූ Crawler Excavator යන්ත්‍රයක් ඇතුළත්ව තිබුණද, විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛනයේ ඒම යතුරු පැදි 02ක් සහ යන්ත්‍රය සඳහන්ව නොතිබුණි.

1.6.2 අත්‍රිම ශේෂය

2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර මුද්‍රිත SA70 හි නොපියවූ අත්‍රිම ශේෂයක් ලෙස දැක්වෙන රු.7,039,497ක ශේෂය, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි, අත්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනයෙහි (ඒසිඒ-3 ආකෘතිය) දක්වා නොතිබුණි.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොගැනීම

මූල්‍ය රෙගුලාසි 214 ප්‍රකාරව පවත්වාගෙන යායුතු බැඳීම් හා බැරකම් පිළිබඳ ලේඛනයක් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙනගොස් නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (ආ)	අයිනිය දෙපාර්තමේන්තුව සතු නොවූ ඉකුත් වර්ෂයන්හි මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා ඇති මාතර මොරවුව පිහිටි ඉඩම් 2හි අයිනිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කළ යුතු	1.6.2(අ)

එම

1.6.1 (ඇ) දෙපාර්තමේන්තුව සතු සියළුම යතුරුපැදි තක්සේරු කර මූල්‍ය 1.6.2 (ඉ) නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවීම.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

(අ) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2025.11.17 දිනැති අංක TOD/REV/01/03/01 දරන ලිඛිත අනුව, භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ගණන් දීමේ නිළධාරියා ලෙස කටයුතු කරනු ලබන ආදායම් සංකේතාංක යටතේ එකතු කරනු ලබන ආදායම් පිළිබඳව අදාළ ප්‍රධාන ගණන් දීමේ නිළධාරීන් හෝ ගණන් දීමේ නිළධාරීන් විසින් අර්ධ වාර්ෂිකව ආදායම් පිළිබඳව ගණන් දීමේ නිළධාරීන් වෙත හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කළයුතු වුවත්, 2019, 2020 හා 2021 වර්ෂවලදී ධීවර වරාය පහසින් වැලි ඉවත් කිරීම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම වෙනුවෙන් අයවිය යුතු රු.8,268,292කින් 2025 වර්ෂයේදී රු.1,840,812ක් අයකරගෙන නිබු අතර නවදුරටත් රු.6,427,479ක් අයවිය යුතුව පැවතියද හිඟ ආදායම් නොමැති බවට වාර්තාකර නිබුණි.

(ආ) ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය වෙත 2017 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31දක්වා කාලපරිච්ඡේදය තුළ ලබාදී ඇති අවසරපත්‍ර වල ප්‍රමාණය ඉක්මවා වැලි කැනීම් සිදුකිරීම සම්බන්ධයෙන් අයවිය යුතු මුදල් රු.79,369,500 ක් විය. නමුත්, එම ආයතනය විසින් රු.64,059,000ක් පමණක් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදල් ලෙස ගණනය කර නිබු අතර දෙපාර්තමේන්තුව විසින් 2025 දෙසැම්බර් 31 දිනට රු.32,096,900 ක් පමණක් අයකර ගෙන නිබුණි.

3.2 වියදම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ මෘදුකාංග නඩත්තු සඳහා සහ ගොඩනැගිලි අලුත්වැඩියා හා පුනරුත්ථාපනය සඳහා වෙන්කර නිබු ඉද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් රු.340,246 ක් හෙවත් සියයට 34 ක් සහ රු.3,316,763 හෙවත් සියයට 33ක් ඉතිරිව පැවතුණි. එසේවුවද පරිගණක සඳහා යොදනු ලබන වෙරස් ගාඩ් නොයෙදීම් හා මාර්ගස්ථ ක්‍රමය ඔස්සේ බලපත්‍ර නිකුත්කිරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීමට සහ දෙපාර්තමේන්තුව සතුව නවදුරටත් අලුත්වැඩියා කලයුතු ගොඩනැගිලි පැවතියද එම කටයුතු සිදුකර නොනිබුණි.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව		අනුකූල නොවීම
(අ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කි.මී. 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණ අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ කිසිදු වාහනයක එලෙස ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.
(ආ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (අ)	සුළු මුදල් අත්තිකාරම් මගින් එක්වරකදී ගෙවීම් කළ හැකි උපරිම සීමාව රු. 5,000ක් වුවත් පවිත්‍රතා සේවාව වෙනුවෙන් මාසිකව එක්වරකදී රු. 20,000 බැගින් ගෙවීම් කර තිබුණි.

3.5 බැංකු ගිණුම් මෙහෙයවීම

දෙපාර්තමේන්තුවේ ජංගම බැංකු ගිණුමිකට සමාලෝචන වර්ෂය අවසානයට සෘජුව ලැබී තිබූ රු. 1,539,544ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම මුදල තුළ 2025 ජූලි හා නොවැම්බර් මාසයන්ට අදාළ ආදායම් අයිතම 22 ක් සඳහා වූ රු. 1,210,544ක් විය. මෙවැනි සෘජු ලැබීම් කාලෝචිතව හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ආදායම් නිවැරදිව වාර්තා නොවීම මෙන්ම වර්ෂය අවසානයේ මුදල් ශේෂය භාණ්ඩාගාරය වෙත නිවැරදිව ප්‍රේෂණය නොවීමද සිදුවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 දැක්ම හා මෙහෙවර

1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 7 (ඉ) හා 12 වගන්ති සහ 2018 වසරේ සංශෝධිත උපදේශක සභාව විසින් අනුමත කරන ලද වෙරළ කළමනාකරණ සැලැස්මේ 6.4.6 ඡේදය ප්‍රකාරව උපදේශක සභාවට බලපත්‍ර නිකුත් කිරීමේ බලයක් ද, පොදු කටයුතු සඳහා මිස පස සිටුවෙන් නිදහස් ව පෞද්ගලික කටයුතු සඳහා බලපත්‍ර නිකුත් කිරීම පිණිස නිර්දේශ ලබාදීමේ බලයක් ද නොමැති අතර සංවර්ධන කාර්යය සඳහා වෙනත් විකල්පයක් නොමැති අවස්ථාවක දී පමණක් ඉදිකිරීම් රහිත "වෙන්කළ ප්‍රදේශය" මහජනතාවගේ පෞද්ගලික නොවන පොදු සංවර්ධන කාර්යයන් සඳහා පමණක් වෙරළ පස සිටුවෙන් නිදහස් කිරීම අනුමත කිරීම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට කළ හැකි විය. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේ උපදේශක සභා විසින් වෙන් කරන ලද ප්‍රදේශයන් තුළ ඉදිකිරීම් සඳහා විරුද්ධත්වයක් නොමැති බවට පෞද්ගලික අයදුම්පත් 12ක් සඳහා බලපත්‍ර ලබා දී නිබීමෙන් බලපත්‍රයක් ලබාදීමෙන් අපේක්ෂිත වෙරළ කලාපය තුළ සංවර්ධන කටයුතු මගින් සිදුවන අහිතකර බලපෑම් වැළැක්වීම හෝ අවම කිරීම යන අරමුණට අනුකූල නොවන බව නිරීක්ෂණය විය.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

(අ) දෙපාර්තමේන්තුවේ 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේ නිමකිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘති 8ක භෞතික ප්‍රගතිය සියයට 10 සිට සියයට 63 දක්වා පරාසයක පැවතීමෙන් අපේක්ෂිත නිමවුම් මට්ටම්වට ලඟාවී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ නිම කිරීමට සැලසුම්කර තිබූ තලෙයිමන්නාරම් නාවික කඳවුර අසල වෙරළ බාදනයට ලක්ව ඇති වෙරළ තීරයේ මීටර් 140 ක සහ යාපනය කන්කසන්තුරෙයි ප්‍රදේශයේ මීටර් 150ක දිගින් යුත් වෙරළාරක්ෂක ගේබියන් බැම්ම ඉදිකිරීමේ ව්‍යාපෘති දෙකේ වැඩ ආරම්භ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම අනුව රු. මි.14ක්වූ ප්‍රතිපාදන යටතේ කළුතර විවේකාරාම පන්සල අසල වෙරළ බාදනයට ලක් වූ මීටර් 130ක ප්‍රදේශයක් සඳහා වෙරළ ආරක්ෂක ගල් වැටියක් ඉදිකිරීම 2025 සැප්තැම්බර් 30 දින වනවිට අවසන් කළ යුතුව තිබුණද කෙෂ්ත්‍රය වෙත දුව්‍ය සැපයීමේ ප්‍රමාදය හා 500gsm Geo textiles සැපයීමේ ප්‍රමාදය හේතුවෙන් ඉදිකිරීම් වැඩ අතරමඟ නවතා දමා තිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

(අ) වෙරළ ආරක්ෂක ඉදිකිරීම් සඳහා භාවිතයට ගැනීමට Geo Textiles වර්ග මීටර් 30000ක් 2025 ජූනි මස 30 දින වන විට මිලදී ගෙන අවසන් කිරීම සඳහා රු.මි.19ක ප්‍රතිපාදන සලසා තිබුණද වර්ෂය අවසානයට Geo Textiles වර්ග මීටර් 6000ක් පමණක් මිලදී ගෙන තිබීමෙන් එහි මූල්‍ය කාර්යසාධනය රු.මි.2.85 ක් සහ භෞතික කාර්යසාධනය සියයට 20 ක් තරම් අඩු මට්ටමක පැවතුණි.

(ආ) බුස්ස වැල්ලබඩ හදිසි වෙරළාරක්ෂණ ගල්වැටිය ඉදිකිරීමේ දුව්‍ය ප්‍රසම්පාදනයේදී යන්ත්‍ර කුලියට ගැනීම් සඳහා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සැපයුම්කරුවකු නොවූ ආයතනයකින් මිල ගණන් කැඳවීම, ලංසු විවෘත කිරීමෙදී අදාළ ලේඛනවල දින මුද්‍රා හෝ කෙටි අත්සන් යොදා නොතිබීම ලංසු විවෘත කිරීමේ වාර්තාවේ අදාල ආයතනයේ නොරතුරු පමණක් අත් අකුරින් ලියා තිබීම පැවතුණි. තවද ලිපි ගොනු පරීක්ෂාවේදී ලංසු විවෘත කිරීමේ වාර්තාවේ නොරතුරු වෙනස් කර හෝ මෙම ලංසුව පසුව ඇතුලත් කර ඇති බව නහවුරු විය.ඒ අනුව 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.3.2 වගන්තියට අනුව රාජ්‍ය ප්‍රසම්පාදනයක තිබිය යුතු සාධාරණත්වය, විනිවිදභාවය සහ වගවීම යන මූලධර්මවලට පටහැනිව ඉහත ප්‍රසම්පාදනයන් සිදු කිරීමට උත්සාහ දරා තිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම රු.මි. 11.9 ක් වූ Volvo Excavator යන්ත්‍රය 2019 සැප්තැම්බර් සිට භාවිතයට නොගෙන ගාල්ල කාර්යාල පරිශ්‍රයේ දිරාපත්වෙමින් පැවති අතර අපහරණය කිරීම සඳහා 2021 වසරේ ප්‍රධාන කාර්යාලය වෙත යොමුකර තිබුණු නමුත් 2026 මැයි 08 වනවිටත් යන්ත්‍රය අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වටිනාකම රු.28,850,000ක් වූ Hyndai 320 LC-9 Crawler Excavator යන්ත්‍රය 2016 දී මිලදී ගෙන පැය 2821 ක අවම කාලයක් පමණක් භාවිතා කර , 2022 වසරේ සිට භාවිතයෙන් ඉවත් කර තිබුණි..

(ඇ) 1989 වර්ෂයේ මිලදී ගෙන තිබූ IT 18B CAT Loader යන්ත්‍රය 2014 සිට ක්‍රියාවිරහිතව පවතින අතර, එහි රේඩියේටර් ඇතුළු කොටස් අළුත්වැඩියාව ආර්ථික වශයෙන් ඵලදායී නොවන බවට තීරණය කර තිබුණි. කෙසේ වෙතත්, 2015 වසරේදී මෙම යන්ත්‍රය වෙන්දේසි කිරීමට තීරණය කළද වසර 10ක් ගතවන තුරුත් එය

ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන්, දිරාපත් වෙමින් පවතින මෙම වත්කමේ වෙළඳපල වටිනාකම් තවදුරටත් අඩු වෙමින් පැවතුණි.

(ඇ) 2017 ඔක්තෝම්බර් සිට ක්‍රියාවිරහිතව ඇති JCB 3CX Backhoe Loader යන්ත්‍රය අපහරණය සඳහා 2021 දෙසැම්බර් 14 දින ප්‍රධාන ගබඩාව වෙත යවා තිබුණද 2026 මැයි 08 දින වන විටත් අපහරණය කිරීමට කටයුතු නොකිරීම නිසා දිරාපත්වෙමින් පැවතුණි.

4.4 පාඩු හා හානි

මොරටුව ප්‍රාදේශීය කාර්යාල භූමියේ නාප්පය අසල අනාරක්ෂිතව ගබඩා කර තිබූ දැල්පෙට්ටි (Gabian Box) 12 ක් 2024 නොවැම්බර් 28 දින සොරාගෙනගොස් තිබීම හේතුවෙන් දෙපාර්තමේන්තුවට රු. 164,408 ක පාඩුවක් සිදුව තිබුණි. තවද, 2025 නොවැම්බර් 24 වන දින සිට කාර්යාලීය CCTV පද්ධතිය අක්‍රියව පැවතීම තුලින් සිදුව තිබූ ආරක්ෂක පද්ධතියේ දැඩි දුර්වලතාවයන් ආයතනයේ පවතින ලිහිල් ආරක්ෂණ විධිවිධාන සහ දුර්වල වත්කම් කළමනාකරණය මෙම සොරකම් සඳහා සෘජුවම බලපා තිබුණි. මේ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාර පරීක්ෂණයක් සිදුකර තිබුණද සොරකම් සඳහා වගකිවයුත්තන් හඳුනාගෙන නොතිබුණි.

4.5 අනාවරිත ඉනුදෙනු

1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ 31 (4) වගන්තිය යටතේ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම වෙනුවෙන් 2015 සිට විගණිත දිනය වූ 2025 දෙසැම්බර් 31 දින දක්වා දෙපාර්තමේතුව විසින් දරා ඇති පිරිවැය රු. 6,668,721ක් වූ අතර අදාල පුද්ගලයන්ගෙන් ආපසු දෙපාර්තමේන්තුව වෙත අයවිය යුතු මුදල් රු. 6,077,995ක් අයකර ගෙන නොතිබුණි.

4.6 කළමනාකරණ දුර්වලතා

(අ) ගබඩාව හා යාන්ත්‍රික වැඩපළ පරිපාලනය

(i) මොරටු මෝදර ප්‍රාදේශීය කාර්යාලයේ තොග පොත් වාර්ෂිකව තුලනය කර ශේෂයන් ඉදිරියට ගෙන ගොස් නොතිබූ අතර මු.රෙ.756 ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකර තිබූ බවට සාක්ෂි නොතිබුණි. භාවිතයෙන් ඉවත් කර තිබූ යන්ත්‍රවල අමතර කොටස් මු.රෙ. 770 ප්‍රකාරව ඉවත් කිරීමට කටයුතු කරද නොතිබුණි.

(ii) මොරටු මෙද්දර ප්‍රාදේශීය කාර්යාලයට අනුබද්ධ යාන්ත්‍රික වැඩපළේ සේවය කළ ක්ෂේත්‍ර සහකාර, විදුලි පැස්සුම්කරු ඇතුළු කාර්ය මණ්ඩලයේ 05 දෙනෙකු 2020 සහ 2025 අතර කාලය තුළ විශ්‍රාම ගැනීමෙන් පසු, ඒ සඳහා නව බඳවා ගැනීම් සිදු නොකිරීම හේතුවෙන් 2025 ජනවාරි 15 දින වන විට එම වැඩපළේ කටයුතු සම්පූර්ණයෙන්ම අක්‍රියව පැවතුණි. මේ නිසා වැඩපළ සතුව පැවති ලේත් යන්ත්‍ර (Lathe Machines), වායු සම්පීඩක (Air Compressors), විදුලි ජනන යන්ත්‍ර (Generators) සහ විදුලි පැස්සුම් උපකරණ වැනි ඉහළ මූලධන වටිනාකමකින් යුත් උපකරණ දීර්ඝ කාලයක් තිස්සේ පරිහරණය නොකිරීම නිසා දිරාපත් වෙමින් පැවතිණි.

(ආ) මාර්ගගත ක්‍රමය ඔස්සේ සංවර්ධන කාර්යයන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම

(i) මාර්ගගත ක්‍රමය ඔස්සේ බලපත්‍ර ලබාදීම 2019 පෙබරවාරි 22 වන දින සිට ආරම්භ කර තිබූ නමුත් 2025 වර්ෂය වන විටත් මාර්ගගත ක්‍රමය හා භෞතික ක්‍රමය යන ක්‍රම දෙකටම බලපත්‍ර නිකුත්කිරීම සිදුකරමින් පැවතුණි.මෙම පද්ධතිය ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණ ලෙස බලපත්‍රයක් නිකුත් කිරීමට ගතවන කාලය අඩු කිරීම දක්වා තිබුණද, ඉදිරිපත් කර තිබූ අයදුම්පත් සඳහා ස්ථානීය පරීක්ෂාවන් සිදුකිරීමට සැලකිය යුතු කාලයක් ගත වී තිබීමෙන් බලපත්‍ර නිකුත් කිරීමේ කාලය අඩුවී නොතිබුණි. මාර්ගගත පද්ධතියේ තොරතුරු අනුව 2025 සැප්තැම්බර් 30 දින වන විට ස්ථානීය පරීක්ෂාවන් සිදුකර තිබුණද වාර්තා ලබා දී නොතිබුණු අයදුම්පත් සංඛ්‍යාව 397ක් වූ අතර එයින් අයදුම්පත් 102 ක් මාස 3ක ඉක්මවූ ඒවා විය.

(ii) නිකුත් කරන බලපත්‍රය වර්ෂයක කාල සීමාවකට පමණක් නිකුත් කරන බැවින් එම බලපත්‍රයේ කාලය අවසන් වීමට පූර්ව අදාල සංවර්ධන කටයුත්ත අවසන් කළ යුතු අතර එසේ නොවන විට එම බලපත්‍රය අළුත් කළ යුතු වුවද බලපත්‍ර අළුත් කර නොතිබූ සියළුම සංවර්ධන කටයුතු අදාල කාල සීමාව තුල සිදුකර අවසන් වී ඇත්ද යන්න සොයා බලා ප්‍රාදේශීය කාර්යාල වලින් වාර්තා ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම්

2025 වර්ෂය තුළ විශ්‍රාම ගත් නිලධාරීන්ගෙන් අයවීමට පැවති ආපදා ණය රු.536,960ක්, උත්සව අත්තිකාරම් රු.3,750ක් සහ දේපල ණය රු.100,612

ක්, ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 13 වැනි ඡේදය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

5 යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ හා 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 33 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව සෑම ආයතනයකම අභ්‍යන්තර විගණනයක් පවත්වාගෙන යායුතු වුවද දෙපාර්තමේන්තුවේ 2025 මැයි මස සිට අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5.2 විගණන හා කළමනාකරණ කමිටුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තියේ සඳහන් විධිවිධානවලට හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 01/2019 අනුකූල ව වර්ෂයකට අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් පැවැත්විය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

2025 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ 540 ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන් 158ක් පුරප්පාඩු ව පැවති අතර ඊට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 16 ක්, තෘතීය හා ද්විතීක මට්ටම්වල තනතුරු 73 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 69 ක් ඇතුලත් විය. අනුමත සංවර්ධන නිලධාරී තනතුරු 90 ක් වුවද, තථ්‍ය සංඛ්‍යාව 102 ක් වූයෙන් 12 ක අතිරික්තයක් විය. ඒ අනුව තථ්‍ය වශයෙන් පවතින තනතුරු සංඛ්‍යාව මත රාජකාරී කටයුතු පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව සමාලෝචනය කර අවශ්‍යතාවය අනුව සංශෝධනයන් සිදුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

කේ.එච්.යූ.ඩී.සරත් කුමාර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04
කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය ප්‍රතිදානය		
	100% -90%	75% - 89%	50% -74%
ඵලදායී ආරක්ෂිත වෙරළ දිග			72%
ඵලදායී කෘතිම වැලි පෝෂිත වෙරළ තීරයේ දිග			0%
පිරිසිදු කරන ලද වෙරළ දිග	100%		
සංරක්ෂණය කරන ලද සංවේදී කලාප වර්ග ප්‍රමාණය		86.8%	
ප්‍රතිශ්ඨාපනය කරන ලද කඩොලාන ප්‍රමාණය			
වෙරළබඩ ජල තත්වය pH 8ට වඩා වැඩි මට්ටමක තිබේදැයි පරීක්ෂා කිරීම	100%		
සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාණය	100%		
දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය	100%		

05 වන පරිච්ඡේදය
ඉටුකරගත හැකි තිරසාර සංවර්ධන ඉලක්කවල (SDG) කාර්ය සාධනය

5.1 හඳුනාගත් අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක (SDG)

ආයතනික අරමුණ අනුව ඉලක්ක	ක්‍රියාමාර්ග	ජයග්‍රහණය පිළිබඳ දර්ශකල	2024 ඉලක්ක	2024 ප්‍රගතිය	% 0- 49	%50 - 74	% 75 - 100	SDG රාමුව තුළ ලබා දී ඇති අදාළ ප්‍රතිපත්ති ඉලක්කය
දේශගුණික විපර්යාස සහ එහි බලපෑම් වලට එරෙහිව සටන් කිරීමට ඉක්මන් පියවර ගන්න								
1. දේශගුණය ආශ්‍රිත වෙරළබඩ ආපදා හේතුවෙන් අහිතකර බලපෑම් වැලැක්වීම සහ සැලකිය යුතු ලෙස අඩු කිරීම	1.1 වෙරළ ආරක්ෂක ව්‍යුහ ඉදිකිරීම. 1.2. කෘතිම වැලි පෝෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. 1.3. කඩොලාන තීර ප්‍රතිශ්ඨාපනය කිරීම	a. ඵලදායී ආරක්ෂිත වෙරළ දිග b. ස්ථාවර කරන ලද ඵලදායී කෘතිම වැලි පෝෂිත වෙරළ දිග C. වගා කරන ලද ප්‍රමාණය	3500m 0 1000m^2	2831m 0 2400m^2	0		81 100	13.1 සෑම රටකම දේශගුණය ආශ්‍රිත උවදුරු සහ ස්වභාවික විපත්වලට ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තනය වීමේ හැකියාව ශක්තිමත් කිරීම
තිරසාර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය කිරීම සහ තිරසාර ලෙස භාවිතා කිරීම								
2. සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ අඩු කිරීම සහ විවිධ ස්ථානවල වෙරළබඩ ජල තත්ත්ව පරාමිතීන් (pH) මැනීම සහ දත්ත හුවමාරු කිරීම	2.1. වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 2.2. වෙරළබඩ ජල තත්ත්ව පරාමිතීන් මැනීම	d. පිරිසිදු කරන ලද සමුච්චිත වෙරළ දිග e. 2026 දක්වා සාමාන්‍ය වාර්ෂික වෙරළබඩ ජලයේ ඵ්‍ය මට්ටම 8.0 ට වැඩියෙන් පවතීදැයි පරීක්ෂා කිරීම.	2km ස්ථාන 04ක පරාමිතීන් මැනීම සහ දත්ත හුවමාරු කිරීම.	20.6km ස්ථාන 04ක පරාමිතීන් මැනීම සහ දත්ත හුවමාරු කිරීම සිදු කර ඇත.			100 100	14.1 2025 වන විට, සමුද්‍ර සුන්බුන් සහ පෝෂක දූෂණය ඇතුළුව, විශේෂයෙන්ම ගොඩබිම පදනම් වූ ක්‍රියාකාරකම් වලින්, සියලු වර්ගවල සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ සැලකිය යුතු ලෙස අඩු 14.3 සෑම තරාතිරමකම වැඩිදියුණු කරන ලද විද්‍යාත්මක සහයෝගිතාවය ඇතුළුව සාගර ආම්ලිකතාවයේ බලපෑම් අවම කිරීම සහ ඒවාට විසඳුම් සෙවීම
3. සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ අඩු කිරීම සහ විවිධ ස්ථානවල වෙරළබඩ ජල තත්ත්ව පරාමිතීන් (pH) මැනීම සහ දත්ත හුවමාරු කිරීම		වැලි කඳු, කඩොලාන සහ ලවණ වගුරු හා සංවේදී පරිසර පද්ධති සංරක්ෂණය කරන ලද ප්‍රමාණය	70 Hec	0	0			14.5 2020 වන විට, ජාතික හා ජාත්‍යන්තර නීතියට අනුකූලව සහ පවතින හොඳම විද්‍යාත්මක තොරතුරු මත පදනම්ව වෙරළබඩ සහ සමුද්‍ර ප්‍රදේශවලින් අවම වශයෙන් සියයට 10 ක් සංරක්ෂණය කරන්න.

5.2 තිරසාර සංවර්ධන අරමුණු වල ජයග්‍රහණ සහ අභියෝග කෙටියෙන් විස්තර කරන්න

හඳුනා ගත් තිරසාර සංවර්ධන ඉලක්ක කරා හැකි උපරිමයෙන් ළඟා වීමට උත්සාහ කරන අතර ඉන් සමහරක් ඉලක්ක පාර්ශවකාර ආයතන සමග එකමුතුව ඉටු කර ගත යුතු ව ඇත.

පරිච්ඡේදය 06
මානව සම්පත් පැතිකඩ

6. 1 සේවක කළමනාකරණය

	අනුමත සේවක	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	43	27	16
තෘතික	4	2	2
ද්විතික	322	251	71
ප්‍රාථමික	171	102	69
මුළු ගණන	540	382	158

6.2 ආයතනයේ ක්‍රියාකාරිත්වයට මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය කෙටියෙන් සඳහන් කරන්න.

01) ඉදිකිරීම් ස්ථානවල භෞතික හා මූල්‍යමය ප්‍රගතිය අත්කර ගැනීමේදී ඉංජිනේරුවන්, තාක්ෂණික නිලධාරීන් සහ ක්ෂේත්‍ර සහායකයින් හිඟය අහිතකර ලෙස බලපායි.

02) සංවර්ධන නිලධාරීන් වැනි සමහර කාණ්ඩවල අතිරික්ත සේවක සංඛ්‍යාව (12ක්) අනවශ්‍ය මුදල් වියදම්වලට හේතු වන අතර මූල්‍ය කාර්ය සාධනයේ කාර්යක්ෂමතාව අඩු කරයි.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණුව ලත් කාර්ය මණ්ඩලය	වැඩසටහනේ කාල සීමාව	මුළු ආයෝජනය (රු.1000)	වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	දැනුම ලබා ගැනීම
MS Access භාවිතයෙන් දත්ත සමුදා යෙදුම පිළිබඳ වැඩමුළුව	02	2025.12.18 සිට 2025.12.19	30.0	දේශීය	
පොදු ප්‍රසම්පාදනය පිළිබඳ වැඩමුළුව	14	2025.11.03	94.5	දේශීය	
විනය පරීක්ෂණ පිළිබඳ වැඩමුළුව	03	2025.10.15	17.5	දේශීය	
ගබඩා කළමණාකරණය පිළිබඳ පුහුණුව	06	2025.10.03	39.0	දේශීය	
ආකල්ප හා වෘත්තීය දැනුම පිළිබඳ වැඩමුළුව	11	2025.09.02	70.0	දේශීය	
ප්‍රායෝගික වෙරළබඩ ඉංජිනේරු විද්‍යාව සඳහා පියවරෙන් පියවර මාර්ගෝපදේශනය	01	2025.07.20 සිට මාස 03ක් කඩින් කඩ	39.5	දේශීය	
වෘත්තීය වර්ධනය පිළිබඳ වැඩසටහන	17	2025.07.29	38.5	දේශීය	
විද්‍යාත්මක, පිරිමැසුම්දායක,සහ ආරක්ෂිත රිය පැදවීම පිළිබඳ පුහුණුව	06	2025.07.24	42.0	දේශීය	
පොදු ප්‍රසම්පාදනය පිළිබඳ වැඩමුළුව	04	2025.07.08	30	දේශීය	
නායකත්ව පුහුණුව	38	2025.05.28	6.191	දේශීය	
රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ වැඩමුළුව	01	2025.05.26	19.2	දේශීය	
මාණ්ඩලික නිලධාරීන් සඳහා තාක්ෂණික වාර්තාකරණය පිළිබඳ වැඩමුළුව	30	2025.03.19	38.154	දේශීය	
ලිපිගොනුකරණය පිළිබඳ වැඩමුළුව	36	2025.02.25	9.1	දේශීය	

ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

- ආයතනයේ විවිධ විෂයන් පිළිබඳ දැනුම යාවත්කාලීන වීම තුලින් ඵලදායිතාව ඉහල නැංවීමට හැකි වීම.
- පුහුණු වැඩසටහන් තුලින් ආකල්ප හා පුද්ගල සංවර්ධනය, සාමූහික වගකීම් වැඩි දියුණු වීම.
- සේවකයින්ගේ සේවා අවශ්‍යතා හඳුනා ගැනීම් තුලින් ඔවුන් ඵලදායි මට්ටමට ලගා වීමට අවශ්‍ය පහසුකම් සැපයීම කඩිනම් වීම.
- පුහුණුව තුලින් ලබා ගන්නා දැනුම නව ක්‍රමවේද හා කාර්යක්ෂම කාර්යාල ක්‍රම තුලින් සේවක අභිප්‍රේරණය ඇති කිරීමට හැකි වීම.

පරිච්ඡේදය 07
අනුකූලතා වාර්තාව

අංකය	අයදුම් කිරීමේ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ)	අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර ඇත**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශය	අනුකූල		
1.2	රාජ්‍ය අත්තිකාරම් ගිණුම	අනුකූල		
1.3	වෙළඳ හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත් සහ ලේඛණ නඩත්තු කිරීම (FR445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ (267/2018) අනුව ස්ථාවර වත්කම් ලේඛණ නඩත්තු කර යාවත්කාලීන කර ඇත.	අනුකූල		
2.2	පුද්ගලික දීමනා ලේඛනය /පුද්ගලික දීමනා කාඩ්පත් නඩත්තු කරිම සහ යාවත්කාලීන කරිම.	අනුකූල		
2.3	විගණන විමසුම් ලේඛනය නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම.	අනුකූල		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලියාපදිංචි කර නඩත්තු කර යාවත්කාලීන කර ඇත.	අනුකූල		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශනියමිත දිනට භාණ්ඩාගාරයට (CIGAS) සකස්කර ඉදිරිපත් කරනු ලැබේ	අනුකූල		
2.6	චෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛනය පවත්වා ගෙන යාම යාවත්කාලීන කර ඇත.	අනුකූල		
2.7	භාණ්ඩ වට්ටෝරු ලේඛනය යාවත්කාලීන කර යාවත්කාලීන කර ඇත	අනුකූල		
2.8	තොග ලේඛනය නඩත්තු කර යාවත්කාලීන කර ඇත	අනුකූල		
2.9	පාඩු ලේඛනය නඩත්තු කර යාවත්කාලීන කර ඇත	අනුකූල		
2.10	බැඳීම් ලේඛනය නඩත්තු කරිම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ135)**			
3.1	මූල්‍යය ආයතනය තුල පවරා ගැනීම.	අනුකූල		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කිරීම	අනුකූල		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම such manner so as to pass each transaction through two or more officers	අනුකූල		

3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදි ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීම	අනුකූල		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම සකස් කිරීම	අනුකූල		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලස්ම සකස් කිරීම	අනුකූල		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම prepared and submitted to the NBD on due date	අනුකූල		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. submitted to the Treasury Operations Department on time	අනුකූල		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිලිතුරු ලබා දි තිබීම	අනුකූල නොවේ	ප්‍රාදේශිය කාර්යාල මගින් තොරතුරු ලබා ගැනීමේදී සැලකියයුතු කාලයක් ගතවේ.	කඩිනමින් පිළිතුරු ලබා දෙන ලෙස උපදෙස් දී ඇත.
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රේ.134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදි විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සලස්ම සකස් කිරීම prepared at the beginning of the year after consulting the Auditor General in terms of Financial Regulation 134- 2&& DMA/1-2019	අනුකූල		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදි පිලිතුරු සපයා තිබීම	අනුකූල නොවේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණය විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල		
7	**විගණන කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන තිබීම.	අනුකූල නොවේ.	ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වී ඇති බැවින් විගණන කළමණාකරන කමිටු නොපැවැත්වින	හැකි ඉක්මනින් ප්‍රධාන අභ්‍යන්තර විගණක වරයෙකු පත් කල යුතුය.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදි ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම	අනුකූල		

	සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියකු පත්කර එම නිලධාරියා පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ,ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල		
8.5	ගර්හිත භාණ්ඩපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ.	කැබිනට් තීරණයට අනුව විකිණීමේ ක්‍රියා පටිපාටිය ප්‍රමාද වී තිබුණි	
9.3	වාහන ලොග් පොත පවත්වා ලනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල		
9.4	සෑම වාහන අනතුරක්ම සම්බන්ධයෙන් ම ම.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල නොවේ	රාජකාරී කටයුතු බහුල වීම හේතුවෙන් වාහන කිහිපයක පමණක් ඉන්ධන පරීක්ෂාව සිදු කර ඇත.	2026 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර ඇත
9.6	කල්බදු කාල සමාවෙන් අනතුරුව , බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අදාළ නොවේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කරතිබීම	අනුකූල		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල		
11.2	මු.රේ 94(1) ප්‍රකාරව ,සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට වළඹීම	අනුකූල		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල		

12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සමබන්ධයෙන් ම.රේ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල		
14	**අග්‍රිම ගිණුම**		ප්‍රමාද වී ඇත	නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇත
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, වීම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල		
15	**අදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුක්ලව, රැස් කළ අදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ		
15.2	රැස් කර තිබූ අදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම අදායමට බැර කර තිබීම	අදාළ නොවේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ අදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අදාළ නොවේ	සංවර්ධන නිලධාරී තනතුරු වල අතිරික්තයක් පවතී.	වීම අතිරික්ත ප්‍රමාණය අනුමත කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුට ලිපි යවා ඇත.
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ල්බිතව තිබීම.	අනුකූල		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙක් පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යෑම	අනුකූල		

17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වේබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල			
17.3	තොරතුරු දැන ගැනීමේ පණතේ 08වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා කර තිබීම	අනුකූල			
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**				
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල			
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවෙදයක් සකස් කොට තිබීම	අනුකූල			
19	**මානව සම්පත් සැලස්ම සම්පාදනය කිරීම**				
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලස්මක් සකස් කොට තිබීම.	අනුකූල			
19.2	කාර්ය මණ්ඩලයේ සියළුම සමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල			
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩල සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල			
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලස්ම පිළියෙළ කිරීම. ධාරිතා සංවර්ධනය කිරීම නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් පත් කොට තිබීම.	අනුකූල			
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**				
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඳින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල			